විසර්ජන ශීර්ෂය 123 -ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය.

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තාව.

1 කොටස

-----------

**ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.**

---

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු.

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 310 | රජයේ කර්මාන්ත ශාලාව |
| 311 | ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ). මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,018,422,253 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.2,442,438,408 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.5,249,997 ක

සිට රු.532,017,595ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 21 ක් දක්වා පරාසයක පැවැතිණ. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 123 | ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය | 317,210,000 | 2,212,975,253 | 300,133,926 | 1,698,033,732 | 17,076,074 | 514,941,521 |
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 234,771,000 | 20,145,000 | 216,569,225 | 17,832,499 | 18,201,775 | 2,312,501 |
| 310 | රජයේ කර්මාන්ත ශාලාව | 53,286,000 | 31,225,000 | 52,210,650 | 14,098,373 | 1,075,350 | 17,126,627 |
| 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 144,335,000 | 4,475,000 | 139,359,552 | 4,200,451 | 4,975,448 | 274,549 |
| එකතුව | | 749,602,000 | 2,268,820,253 | 708,273,353 | 1,734,165,055 | 41,328,647 | 534,655,198 |

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය.

---

විවිධ කාර්යයන් සඳහා වෙනත් දෙපාර්තමේන්තුදෙකක් විසින් එකතුව රු. 536,150,428ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය 2012දෙසැම්බර් 31 දිනට | ඉතිරිය පිළිබඳ නිරීක්ෂණය සංක්ෂිප්තව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 534,665,428 | 346,270,307 | 188,395,121 | ප්‍රමාණවත් අග්‍රිම නොමැතිවීම, කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ අත්හිටුවීමට සිදුවී තිබීම නිසා වැඩ ප්‍රමාදවීම, බිල්පත් ඉදිරිපත් නොවීම,සේවාදායක වෙත ඉතිරි මුදල් ආපසු යවා නොතිබීම හෝ රජයේ ආදායමට නොගැනීම. |

| | | | | |
|---|---|---|---|---|
| ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව | 1,485,000 | 1,000,000 | 485,000 | බිල්පත් ඉදිරිපත් නොවීම |

2.2 අත්තිකාරම් ගිණුම්

---------------------

2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

--------------------------------------------

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

------------------------------------------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 123 | 12301 | 9,000,000 | 7,657,693 | 4,000,000 | 8,553,277 | 80,000,000 | 23,497,785 |
| 309 | 30901 | 20,000,000 | 12,158,356 | 12,000,000 | 17,729,093 | 95,000,000 | 45,202,522 |
| 310 | 31001 | 28,000,000 | 18,437,053 | 18,000,000 | 23,119,299 | 127,000,000 | 88,871,083 |
| 311 | 31101 | 15,000,000 | 7,287,661 | 7,000,000 | 11,651,331 | 106,000,000 | 36,865,991 |

## 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

### (අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

වාණිජ අත්තිකාරම් ගිණුමක් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 310 | 31003 | 325,000,000 | 322,022,593 | 280,000,000 | 322,455,300 | 180,000,000 | 126,038,528 | 5,000,000 | 2,226,492 |

### (ආ) මූල්‍ය ප්‍රතිඵල

වාණිජ අත්තිකාරම් ගිණුමක මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| දෙපාර්තමේන්තුව | විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2012 | | 2011 | |
| | | | ලාභය (කල්පිත ගාස්තු රහිතව) | ලාභය (කල්පිත ගාස්තු සහිතව) | ලාභය (කල්පිත ගාස්තු රහිතව) | ලාභය (කල්පිත ගාස්තු සහිතව) |
| | | | රු | රු. | රු. | රු. |
| රජයේ කර්මාන්ත ශාලාව | 31003 | කළ වැඩ අත්තිකාරම් ගිණුම | 101,485,931 | 101,284,931 | 104,088,207 | 103,887,207 |

2.2.3 වානිජ නොවන අත්තිකාරම් ගිණුම්

------------------------------------

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

-----------------------------------------------

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවක වාණිජ නොවන අත්තිකාරම් ගිණුම් කටයුතු එකක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පහත පරිදි සීමා පනවා තිබුණු අතර බැරකම් සීමාව හැර අනෙකුත් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 310 | 31002 | 130,000,000 | 125,346,384 | 120,000,000 | 134,817,796 | 40,000,000 | 30,687,057 | 20,000,000 | 21,242,636 |

2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

---------------------------------

(අ) අග්‍රිම ගිණුම්

--------------

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2012 දෙසැම්බර් 31 දින වන විටඅග්‍රිම ගිණුම්වල රු.4,478,795 ක්වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර |
|---|---|
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 196,006 |
| රජයේ කර්මාන්ත ශාලාව | 4,282,789 |
| එකතුව | 4,478,795 |

(ආ) පොදු තැන්පත් ගිණුම්

------------------------

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.725,176,215 ක්වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය | 6000/0000/000/ 0015/0079 | 3,681,453 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 6000/0000/000/ 0015/0163 | 68,126,472 |
| | 6000/0000/000/ 0015/0176 | 627,232,998 |
| රජයේ කර්මාන්ත ශාලාව | 6000/0000/000/ 0015/0164 | 1,349,297 |
| | 6000/0000/000/ 0015/0046 | 24,032,254 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 6000/0000/000/ 0015/0165 | 753,741 |
| | | 725,176,215 |

2 කොටස

------------

එක් එක් විසර්ජන ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

----------------------------------------------------------------

## 1. විසර්ජන ශීර්ෂය 123- ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය

------------------------------------------------------------------------------------------

### 1.1 විගණන විෂය පථය

----------------------

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 11 දින අමාත්‍යාංශයේ ලේකම් වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි .

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149 , 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ.වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන

පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා වූ ජේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

------------------

(i) අක්මුදල් නොලැබීම හේතුවෙන්,මූලධන වැය විෂයයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් සළසා තිබුණු රු.63,000,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන්,මූලධන වැය විෂයයන් 27 ක් සඳහා සළසා තිබුණු රු.1,375,775,253 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සියයට 15 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම

-----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ රු.1,008,578 ක් වූ තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571ප්‍රකාරවකටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 12301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.71,670 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---

1.4.1 සංයුක්ත සැලැස්ම

---

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4)දරන රාජ්‍ය මුදල්අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

1.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

---

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2013 නොවැම්බර් 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

1.4.3 විගණනහාකළමනාකරණකමිටුව ක්‍රියාත්මකකිරීම

නිවැරදි පියවර සහ පසුවිපරම් කිරීමේ අදහසින් විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය නොකරන බැවින් විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

1.5 කාර්ය සාධනය

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

ජාතිකඉදිකිරීම් ප්‍රතිපත්තිය,ජාතික නිවාස ප්‍රතිපත්තිය සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතබලාත්මක කරවා ගැනීමේ කාර්යයන් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් අවසන්කර නොතිබුණි.

(ආ) දිගුකාලීන කාල ප්‍රමාදයන් සහිතව ඉටුකර නොතිබුණු කාර්යයන්

2008 ජුනි 12 දිනැති අංක අමප/08/0905/344/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැර වෙමින් රාජ්‍ය ඉදිකිරීම් ආයතනවලට භාරදෙන ගොඩනැඟිලි හා ඉංජිනේරුමය කොන්ත්‍රාත්තු පිළිබඳ ඇස්තමේන්තු හා ඒවාට ගෙවියයුතු මිල ගණන් ගැන වාර්තා කිරීමට හා ඒකාබද්ධ අරමුදල යටතේ භාරගන්නා කොන්ත්‍රාත්තු පිළිබඳ ආරවුල්වලට මැදිහත්වීමට ස්ථාවර තාක්ෂණ කමිටුවක් 2008 වර්ෂයේ සිට පිහිටුවා තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, 2008 වර්ෂයේසිට 2012 වර්ෂය දක්වා අතර කාලපරිච්ඡේදය තුළදී මෙම ස්ථාවර තාක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත් පිළිබඳ ඇස්තමේන්තු හා ඒවාට ගෙවියයුතු මිල ගණන් පිළිබඳ ඉල්ලීම් 134 ක් සම්බන්ධයෙන් 2013 ජූලි 31 දිනවන විටත් කමිටු තීරණය නිකුත්කර නොතිබුණු අතර ප්‍රමාද කාලය වර්ෂ 01 සිට වර්ෂ 05 අතර කාලපරාසයකින් යුක්ත විය.මෙම ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්වල

වැඩ අවසන් කිරීමට නොහැකිවීම, අවසන් බිල්පත් සඳහා ගෙවීම් කිරීමට නොහැකිවීම,රඳවුම් මුදල් නිදහස් කිරීමට නොහැකිවී තිබීම ආදීවූ ගැටළු රැසක් නිර්මාණයවී තිබුණි.

අසම්පූර්ණ ලිපිගොනු ඉදිරිපත්කර තිබීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉක්මවූ ඇස්තමේන්තු ඉදිරිපත්කර තිබීම, ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රමාණ බිල් සංශෝධනය කිරීම, පැහැදිළි කිරීම් ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදුවීම හා නිලධාරීන්ගේ හිඟකම මෙම ප්‍රමාදයට හේතුවී ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා එවා තිබුණි.

(ඇ) සැලැසුම් කිරීම
---------------
වාර්ෂිකක්‍රියාකාරීසැලැස්මටඅනුකූලවක්‍රියානොකිරීම
-----------------------------------------------------------

පහතසඳහන්අවස්ථාවලදීක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, ජනසෙවන නිවාස ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ඉලක්කයන්ගේ ප්‍රගතිය සියයට 54ක් පමණක් විය.

(ii) සිහින නිවාස දෙවන ව්‍යාපෘතියට අදාළ මූල්‍ය සහ භෞතික ඉලක්කය පිළිවෙලින් රු.3,800,000 ක් සහ සියයට 100 ක් වුවද, ප්‍රගතියපිළිවෙලින් රු.1,800,000 ක් සහ සියයට 47 ක් පමණක් විය.

(iii) කහතුඩුව ව්‍යාපෘතියට අදාළ මූල්‍ය සහ භෞතික ඉලක්කය පිළිවෙලින් රු.50,000,000 ක් සහ සියයට 100 ක් වුවද, ප්‍රගතිය පිළිවෙලින් රු.29,700,000 ක් සහ සියයට 59 ක් පමණක් විය.

(iv) මත්තෙගොඩ ව්‍යාපෘතියට අදාළ මූල්‍ය සහ භෞතික ඉලක්කය පිළිවෙලින් රු.42,000,000 ක් සහ සියයට 100 ක් වුවද ප්‍රගතිය පිළිවෙලින් රු.11,100,000 ක් සහසියයට 25 ක් පමණක් විය.

(v) ජනසෙවන "කප්රුක"නිවාසව්‍යාපෘතියට අදාළ මූල්‍ය සහ භෞතික ඉලක්කය පිළිවෙලින් රු.15,000,000 ක් සහසියයට 100 ක් වුවද ප්‍රගතිය පිළිවෙලින් රු.5,900,000 ක් සහසියයට 39 ක් පමණක් විය.

1.6 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණයවූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

අමාත්‍යාංශය සතු වාහනයක් 2012 අප්‍රේල් 07 දින අනතුරකට ලක්වීමෙන් රු.1,624,068 ක අලාභානි සිදුවී තිබුණි.එම අලාභයෙන්රු.427,038 ක් රක්ෂණයෙන් ආවරණයවී නොතිබුණුඅතර ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (04) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.7 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

අමාත්‍යාංශය යටතේ ඇති සමහර ආයතන විසින් පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තා නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි. අසම්පූර්ණ ප්‍රගති වාර්තා භාරගෙන තිබුණු අතර ඒවා සම්පූර්ණ කරවා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශය යටතේ ඇති සමහර ආයතනවල කාර්යසාධනය පිළිබඳව නිසි අධීක්ෂණයක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.එවැනි අවස්ථා කිහිපයක් පහතින් දක්වා ඇත.

(අ) වාර්ෂිකක්‍රියාකාරීසැලැස්මටඅනුව, ජනසෙවනනිවාසව්‍යාපෘතියටඅදාළභෞතිකඉලක්කයනිවාස 58,883 ක්වුවද,ප්‍රගතිවාර්තාවෙහිසත්‍යඅගයන්ඇතුළත්කර නොතිබුණු බැවින් ප්‍රගතිය මැනිය නොහැකි විය.

(ආ) අනුමැතියනොළත්ඉදිකිරීම්කඩාදැමීමේව්‍යාපෘතියටඅදාළමූල්‍යඉලක්කයරු.2 ,000,000 ක්වූ අතර ඒවායේ භෞතික ප්‍රගතිය 2012 වර්ෂයේ පළමු කාර්තුවේ සියයට 5 ක් ලෙස දක්වා තිබුණි. අනෙකුත් කාර්තුවල භෞතික ප්‍රගතිය සටහන් කර නොතිබුණි.

1.8 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 20 | 07 |
| (ii) තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii)ද්විතියික මට්ටම | 87 | 73 | 14 |
| (iv)ප්‍රාථමික මට්ටම | 44 | 35 | 09 |
| එකතුව | 162 | 131 | 31 |

## 2. විසර්ජන ශීර්ෂය 309- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

----------------------------------------------------------

### 2.1 විගණනවිෂයපථය

----------------------

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.සමාලෝචිත වර්ෂය සඳහාවූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර්11 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි .

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149 , 150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2.3 විගණන නිරීක්ෂණ

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වාවූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ii) තොරතුරු ඇතුළත් ලිපිගොනු ආදීවූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවෙහි නොතිබීම හේතුවෙන්,හඳුනාගෙන තිබුණු රු.732,711ක්වූ වාහන අලාභයක් සම්බන්ධයෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

මෙම වාහනය 2000 වර්ෂයේ සිට 2002 වර්ෂය අතර කාලය තුළදී අමාත්‍ය ආරක්ෂක අංශයක් වෙත නිදහස්කර තිබුණු බවත්, වාහනයේ සමහර කොටස් ගලවා ගෙන ආපසු දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණු බවත්, එම කොටස් නැවත සපයාගෙන අළුත්වැඩියා කිරීමට වැයවූ මුදල රු.116,775 ක් පොත්වලින් කපාහැරීමට කටයුතු කරන බවත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දන්වා එවා තිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.54,899,287 ක්වූ තැන්පතු 211 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත්අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු. 94,286ක් කොළඹ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු ) කාර්යාලයේ පුනරාවර්තන වියදම් සඳහා වැය කර තිබුණි.

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් සහ අළුත්වැඩියාකටයුතු සඳහා ලැබී තිබුණු මුදල්වලින්, අදාළ කාර්යයන් සම්පූර්ණයෙන්ම නිමකිරීමෙන් පසුව ඉතිරිව තිබුණු රු.1,142,120 ක් එම දෙපාර්තමේන්තුව වෙත ආපසු යවා නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

--------------------------------------------------------------------

විෂය අංක 30901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.572,770 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය
----------------------------------------

2.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 402(1) ප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2013 නොවැම්බර් 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

2.4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

මුදල් රෙගුලාසි 133 හා2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.එසේම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

2.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------

නිවැරදි පියවර සහ පසුවිපරම් කිරීමේ අදහසින් විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය නොකරන බැවින් විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

2.5 අනුකූල නොවීම්

------------------

නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණයවූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 135 | 241,275,062 | අනුමත කාර්ය මණ්ඩලයෙහි ඇතුළත් නොවූ නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු තනතුරක් වෙත, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලවල ගෙවීම් සහතික කිරීමේ බලය පවරාදී තිබුණි.තවද කොළඹ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) කාර්යාලයේ ගෙවීම් |

| | | |
|---|---|---|
| | | සහතික කිරීම සහ අනුමත කිරීම යන කාර්යයන් දෙකම එකම නිලධාරියකු විසින් ඉටු කර තිබුණි. |
| මුදල් රෙගුලාසි138 | 277,972 | කොළඹ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) කාර්යාලයේ සහතික කර නොතිබුණු වවුචර් 05 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |

2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

---------------------------------------

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

-------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ යාපනය දිස්ත්‍රික් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16,800,000 | 2010.02.15 | 2012.08.14 | 9,520,000 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව කොන්ත්‍රාත්කරු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආයතනයේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ප්‍රමාදවී තිබුණි. |
| සහල් පර්යේෂණ ආයතනයේ පරීක්ෂණාගාරය ඉදිකිරීම සහ විදුලි සෝපානයක් සවිකිරීම | 110,110,000 | 2008.05.23 | 2010.05.23 | 18,995,041 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව කොන්ත්‍රාත්කරු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආයතනයේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ප්‍රමාදවී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| සහල් පර්යේෂණ ආයතනයේ සමන්තුරේ නිල නිවාසය ඉදිකිරීම | 7,680,000 | 2012.06.27 | 2012.08.31 | 3,900,000 | කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය නිසා වැඩ ප්‍රමාද විය. (ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය රු.7,400,850 ක් වුවද රු.5,585,635 ක් ගිණුම් වර්ෂය අවසන් වීම නිසා ආපසු යවා තිබුණි.) |
| බදුල්ල ගුරුතලාව තැපැල් කාර්යාලය ඉදිකිරීම | 11,850,000 | 2012.06.17 | 2012.11.15 | 6,640,000 | අධික වැස්ස හා ආරක්ෂිත කුටියේ දොර සවි කිරීමට ප්‍රමාද වීම. |

2.7 කාර්යසාධනය

----------------

ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

--------------------------------------------------

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

රජයේ දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතනවල වැය ශීර්ෂ යටතේ මූල්‍ය ප්‍රතිපාදන සළසා ඇති සීමාවන් ඇතුළත ගොඩනැගිලි සැලැසුම් නිර්මාණය කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ ඉදිකිරීම් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වේ. නමුත් එම කටයුතු සඳහා 2012 වාර්ෂික අයවැය ලේඛනය මගින් ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය ශීර්ෂ සඳහාමුළු මුදල රුපියල් මිලියන 122,044 ක්වෙන් කර තිබුණ නමුත් ඉටුකර තිබුණේ රුපියල් මිලියන1,259ක් එනම් සියයට 1.03 ක්වටිනාකමැති ව්‍යාපෘති 127 ක් පමණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ ඉලක්කගත කරගනිමින් අවශ්‍ය කටයුතු සැලැසුම් කිරීමට හෝ ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.8 අවිධිමත් ගනුදෙනු

-------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණයවූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්
----------------------------------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියේ දැක්වෙන හදිසි ප්‍රසම්පාදනක්‍රමය උපයෝගී කර ගනිමින් අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන තිබුණු බැවින් එකී මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදයෙන් දැක්වෙන තරඟකාරී ස්වරූපයෙන් කටයුතු කිරීමෙන් දෙපාර්තමේන්තුව බැහැරවී තිබුණි.මෙපරිදි කටයුතු කරමින් 2007 ඔක්තෝබර් සිට 2011 දෙසැම්බර් දක්වා කාලය තුළ වටිනාකම රු.530,757,701 ක් සහ 2012 වර්ෂය තුළදී වටිනාකම රු.135,873,040 ක්වූ අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.

(ii) නියැදියට අයත්වූ අළුත්වැඩියා සහ නඩත්තු වැඩ 03 ක ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.22,156,020ක් කොළඹප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) විසින් කොටස් 19කට වෙන්කර ඉහත සඳහන් පරිදි තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවන් වෙතවැඩසටහන් 19 ක් නිකුත් කරමින් ප්‍රදානයකර තිබුණි.

(ආ) අධිකාර බලය නොමැතිවූ ගනුදෙනු
-----------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 ජනවාරි 01 දින සිට 2012 පෙබරවාරි 28 දින දක්වා අතර කාලය සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර නොතිබුණු නමුත් 2011 වර්ෂයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත 2012 ජනවාරි සිට පෙබරවාරි 28 දින දක්වා කාලය තුළදී අළුත්වැඩියා හා නඩත්තු වැඩ 12 ක් අධිකාර බලයකින් තොරව කොළඹ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) විසින් ප්‍රදානය කර තිබුණි.මෙහි මුළුවටිනාකමරු.6,665,738 ක් විය.

(ii) මුළු වටිනාකම රු.මිලියන 20 ක මූල්‍ය සීමාව තුළ එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත වැඩ පැවරීමේ බලය ලබාදී තිබුණු නමුත්, කොළඹ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) විසින් එම මූල්‍ය සීමාව ඉක්මවා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත අවස්ථා 28 කදී වැඩ පවරා තිබුණු අතර රු.මිලියන 20 ක මූල්‍යසීමාව ඉක්මවූ මුළු වටිනාකම රු.14,681,574ක් විය.

(ඇ) වෙනත්

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) විසින්Special Schedule of Rate(SSR) අගයන් ඇස්තමේන්තු කර වැඩපත් පිළියෙල කර තිබුණු අතර කාර්යය නිමවීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන සත්‍ය බිල්පත් පදනම් කර ගනිමින් SSR අගයන් නැවත සංශෝධනය කර කළමනාකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. තවද 2010 ජුනි 23 දිනැති අංක 02/2010 දරන ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව,SSR අගයන් සඳහා ගෙවීම් කිරීමට පෙර ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබාගත යුතුවේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* SSR අගයන් ඇස්තමේන්තු කිරීමේදී, ද්‍රව්‍ය වටිනාකම් තහවුරු කර ගැනීම සඳහා වෙළෙඳ පොළේ මිල ගණන් ලබා ගෙන නොතිබුණි.

* කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන සත්‍ය බිල්පත් පදනම් කර ගනිමින් ඇස්තමේන්තු ගත SSR අගයන් සංශෝධනය කිරීමේ ක්‍රියා පිළිවෙත ප්‍රශ්නකාරී විය.

* SSR අගයන් සඳහා අනුමැතිය ලබාදීමේ ප්‍රමාදයක් පවතින බව තහවුරු විය.

* වැඩ සටහන් 09 ක් වෙනුවෙන් පිළියෙල කර තිබුණු මුළු වටිනාකම රු.7,286,566 ක්වූSSRඅගයන් සඳහා අනුමැතිය ලැබීමට ප්‍රථම, සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි.

(ii) අදාළ අළුත්වැඩියාහෝනඩත්තුකටයුතු ආරම්භ කිරීමෙන් පසු සහ බොහෝ විට වැඩය නිමවීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩ සටහන් නිකුත් කර තිබුණු අවස්ථා විය. (2012 මාර්තු 01 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා වු කාල පරිච්ඡේදය තුළදී කොළඹ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) විසින් නිකුත් කර තිබුණු මුළු පිරිවැය රු.108,445,767 ක් වූ වැඩසටහන් 207 න් මුළු පිරිවැය රු.26,106,434 ක් වු වැඩසටහන් 48 ක්ම වැඩය ආරම්භ කිරීමෙන් පසු හෝ වැඩය අවසන්වූ පසු නිකුත් කරන ලද වැඩ සටහන්වූ අතර එහි ප්‍රතිශතය සියයට 23 ක් විය.) මෙය අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රධාන දූර්වලතාවයක් වන අතරම, වැඩසටහන්වලට අදාළ කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමටද මෙමගින් ඉඩකඩ සැලසී තිබුණි.

2.9 කළමනාකරණ දූර්වලතා

----------------------------

පහත සඳහන් දූර්වලතාවයන් නිරීක්ෂණය විය.

විසදා නොතිබුණු විගණන ඡේද

--------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු නිම නොවූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමු ගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2009 | 05(ඇ) | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ගෙවීම් අවිධිමත්වීම සහ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට ප්‍රධාන ගණකාධිකාරී පත්කර නොතිබීම හේතුවෙන් මතුවන අභ්‍යන්තර ගැටළු නිරවුල් කිරීම සඳහා වහාම පියවර ගත යුතු වුවත්, එසේ කර නොතිබුණි. |

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨමට්ටම | 110 | 65 | 45 |
| (ii) තෘතියිකමට්ටම | 23 | 03 | 20 |
| (iii) ද්විතියික මට්ටම | 208 | 169 | 39 |
| (iv) ප්‍රාථමික මට්ටම | 178 | 138 | 40 |
| එකතුව | 519 | 375 | 144 |

## 3. විසර්ජන ශීර්ෂය 310- රජයේ කර්මාන්ත ශාලාව

-----------------------------------------------------

### 3.1 විගණනවිෂයපථය

----------------------

රජයේ කර්මාන්ත ශාලාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර් ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහාවූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර්11දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි .

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149 , 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

3.3 විගණන නිරීක්ෂණ

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව රජයේ කර්මාන්ත ශාලාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වාවූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.12 දක්වාවූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

(i) දෙපාර්තමේන්තුවවිසින්පහතදැක්වෙනලේඛනවිධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛනය | මුදල් රෙගුලාසි 371 |
| වාහන ලේඛනය , ලොග් පොත් සහ ධාවන සටහන් | 1999 පෙබරවාරි 22 දිනැති අංක 6/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි සහ පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

(ii) ණය ලිපිගොණු සහ අදාළ අනෙකුත් තොරතුරු ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවෙහි නොතිබීම නිසා එකතුව රු.165,379ක්වූ රජයේ නිලධාරීන් 06දෙනෙකුට නිකුත් කර තිබුණු ණය සහ ණය ආපසු අයකර ගැනීම් පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) අයවැය සහය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ ලබාගත් ප්‍රතිපාදන

---

(i) අක්මුදල් නොලැබීම හේතුවෙන්, මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් සළසා තිබුණු රු.11,500,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් සළසා තිබුණු රු.5,500,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.4,336,645 ක්වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 78 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) අග්‍රිම ගිණුම

---

මුදල්රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී මාස 01 ත් මාස 03 ත් අතර කාලයක ප්‍රමාදයකින් පසුව රු.155,651 ක අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 31001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් රු.1,103,512 ක්ද, වැඩ තහනම්කර ඇති නිලධාරීන්ගෙන් රු.312,550 ක්ද, සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් රු.721,152 ක්ද වශයෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,137,214 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඉ) වානිජ අත්තිකාරම් ගිණුම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන්කරනු ලැබේ.

(i) 2012 වර්ෂයසඳහාවූපිළියෙල කර තිබුණු වානිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන්අහිතකර විගණනමතයක්ප්‍රකාශකර ඇත.

(ii) විෂය අංක 31003දරන කළවැඩ අත්තිකාරම් ගිණුමේ 1995 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාල පරාසයක් තුළ රාජ්‍ය ආයතන 811 කින් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු82,575,255 ක් වූ අතර,එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

3.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

-------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැතිඅංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළතපාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2013 නොවැම්බර් 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

### 3.4.2 අභ්‍යන්තරවිගණනය

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.එසේම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ විගණනයක් සිදුකර නොතිබුණි.

### 3.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.

නිවැරදි පියවර සහ පසුවිපරම් කිරීමේ අදහසින් විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය නොකරන බැවින් විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

## 3.5 වත්කම්කළමනාකරණය

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) ඉඩම් | අක්කර02 කට අධික ප්‍රමාණයක් | වර්ෂ 20 කට අධික කාලයක සිට අනවසර පදිංචිකරුවන් බුක්තිවිදින බව තහවුරු විය. |
| (ii) ගොඩනැගිලි (නිල නිවාස) | 02 | වර්ෂ 01 |
| (iii) මෝටර් වාහන | 03 | මෝටර් වාහන දෙකක නිෂ්ක්‍රීය කාලය සොයා ගත නොහැකිවූ අතර එක් වාහනයක් වර්ෂ 02 ක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි. |

(iv) යන්ත්‍ර සූත්‍ර

| | | |
|---|---|---|
| ලෝහ හැරීම සඳහා යොදාගනු ලබන යන්ත්‍ර | 01 | වර්ෂ 10 කට අධික කාලයක් |
| පවුඩර් කෝටින් යන්ත්‍රාගාර | 01 | වර්ෂ 01කට අධික කාලයක් |
| තහඩු කපන යන්ත්‍ර | 01 | වර්ෂ 02 කට අධික කාලයක් |

3.6 අනුකූලනොවීම්

-----------------

(අ) නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) ආයතනසංග්‍රහය | | |
| ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ1:1 හා 2.3 උපවගන්ති | 30,260,000 | නියමිත වර්ග අඩි ප්‍රමාණයට වඩා අඩු වර්ග අඩි ප්‍රමාණයක් සහිතව මාණ්ඩලික ශ්‍රේණි සඳහා නිවාස 08 ක් ඉදිකර තිබුණු අතර ඒවා ශ්‍රේණිගත කර නොතිබුණි. |
| ආයතනසංග්‍රහයේXIX පරිච්ඡේදයේ4:2 උපවගන්තිය | | මාණ්ඩලික ශ්‍රේණියට අයත් නිල නිවාස, සාධාරණ ප්‍රතිපත්තියකින් තොරව ලබාදී තිබුණු අතර ඒවා මාණ්ඩලික නොවන නිලධාරීන් වෙතද ලබාදී තිබුණි. |
| ආයතනසංග්‍රහයේXIX පරිච්ඡේදයේ 6.1 උපවගන්තිය | | බදු කාලය වර්ෂ 05 ඉක්මවා නිවාසවල පදිංචිවී සිටින අවස්ථා 16 ක් විය. |

3.7 කාර්ය සාධනය

----------------

සැලැසුම් කිරීම

--------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම

-----------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය<br>------------- | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත ආදායම<br>------------<br>(රු.මිලියන) | වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව ඉලක්කගත ආදායම<br>-----------<br>(රු.මිලියන) | ප්‍රගති සමාලෝචන වාර්තා වලට අනුව වාර්ෂික ප්‍රගතිය<br>-----------------<br>(රු.මිලියන) | වාර්ෂික ප්‍රගතියේ ප්‍රතිශතය<br>----------- | |
|---|---|---|---|---|---|
| දැදුරු ඔය ව්‍යාපෘතිය- වාන් දොරටු 8 ක් සාදා සවිකිරීම | 155 | 50 | 19.69 | 13 | ක්‍රියාකාරී සැලැස්මට අනුව |
| අත්තික්කාව ව්‍යාපෘතිය - වාන්දොරටු 4 ක් ඉදිකිරීම | 30 | 8.33 | 4.03 | 13 | |
| කැලිගමව්‍යාපෘතිය - වාන් දොරටු 4 ක් ඉදිකිරීම | | 5 | 1.38 | 28 | ප්‍රගති වාර්තාවට අනුව |

3.8 බැංකුගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

--------------------------------------

රජයේ කර්මාන්ත ශාලාවේ මූල්‍ය පාලනයේදී නිසි අභ්‍යන්තර පාලන පිළිවෙත් අනුගමනය කර නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල නිවැරදිබව සහ විනිවිදබව පිළිබඳව හෝ එදිනට බැංකු ශේෂයේ නිවැරදිබව පිළිබඳව හෝ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. ඊට හේතුවූ කරුණු පහත දක්වා ඇත.

(අ) 2013 සැප්තැම්බර් 15 දින වන විටත් 2013 ජනවාරි සිට අගෝස්තු දක්වාවූ මාස 08ක් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර්මාසයට අදාළබැංකුසැසඳුම් ප්‍රකාශනය 2013 අප්‍රේල් මාසයේදී පිළියෙල කර තිබුණි.

(ඇ) 2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීම සහ පරීක්ෂා කිරීම සහතික කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනය නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණු බව පහත දැක්වෙන කරුණු හේතුවෙන් තහවුරු විය.

(i) උපලබ්ධි නොවූ තැන්පතුරු.8,242 ක් බැංකු සැසඳුමෙහි දක්වා තිබුණු නමුත් , මුදල් පොතට අනුව එහි අගය රු.28,242 විය.

(ii) 2012 දෙසැම්බර් 31 දිනවන විට ගෙවීම් කර තිබුණු රු.23,408 ක්වූ චෙක්පත, බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පතක් ලෙස බැංකු සැසඳුමෙහි දක්වා තිබුණි.

(iii) 2012 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත්වී නොතිබුණු රු.28,938 ක්වූ චෙක්පත, බැංකු සැසඳුමෙහි රු. 22,282 ක් ලෙස දක්වා තිබුණි.

(iv) 2012 නොවැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුමට අනුව, වටිනාකම රු.141,091 ක්වූ චෙක්පත් 2 ක් ගෙවීම සඳහා ඉදිරිපත්වී නොතිබුණු අතර එම චෙක්පත් 2012 දෙසැම්බර් මාසය තුළදීද බැංකුවට ඉදිරිපත්වී නොතිබුණු නමුත්, එම වටිනාකම බැංකු සැසඳුමෙහි දක්වා නොතිබුණි.

(v) මුදල් පොතට අනුව නිකුත් කළ චෙක්පත් ලෙස හඳුනා ගත නොහැකිවූ මුළු වටිනාකම රු.86,682 ක්වූ චෙක්පත් 4 ක් ගෙවීම සඳහා ඉදිරිපත්වී නොතිබුණු චෙක්පත් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි ඇතුළත් කර තිබුණි.

3.9 මත භේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

දෙපාර්තමේන්තුව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණයවූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සැපයුම්කරුවන් වෙත යවා තිබුණු අමුද්‍රව්‍ය සාම්පලය කාර්යාල ලිපිගොණුවට අමුණා නොතිබීම,භාණ්ඩ සැපයීමට ප්‍රථම රු.31,500 ක්වූ මුළු මුදලම සැපයුම්කරු වෙත ගෙවා තිබීම,ඒ හේතුවෙන් පිරිවිතරවලට අනනුකූලව ලැබී තිබුණු භාණ්ඩ ආපසු යැවීමට සිදුවී තිබුණද සැපයුම්කරුභාණ්ඩ භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබීම,අමුද්‍රව්‍ය සාම්පලයට වඩා වෙනස් අමුද්‍රව්‍යයක් යොදාගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කර තිබුණු බව භෞතික විගණන පරීක්ෂණයේදීද තහවුරු වුවද දෙපාර්තමේන්තුවේ නීති සහකාරවරියවිමර්ශණ නිලධාරියකු ලෙස පත්කරමින් ලබාගෙන තිබුණු විමර්ශණ වාර්තාවේ වැරදි නිර්දේශයට අනුව භාණ්ඩ සියල්ල ආපසු භාරගෙන තිබීම යනාදීවූ කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු කම්කරුවන්ගේ උඩවැසුම් 18 ක් පිළිබඳ ගනුදෙනුව මතභේදාත්මක විය.

(ආ) අවශ්‍යතාවයට නොගැලපෙන Powder Coating Powder කි.ග්‍රෑ. 1000 ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.560,000 ක් වැයකර තිබුණු අතර සාම්පල් නිවැරදි බවට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කිරීමෙන් පසු ද්‍රව්‍ය සැපයුම කර තිබුණු බැවින්, ද්‍රව්‍ය ආපසු භාරගැනීම සැපයුම්කරු විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දින රු.29,000 ක් වැය කරමින් Dryre Element 02 ක්මිලදී ගෙන තිබුණු අතර අවශ්‍යතා පිරිවිතර නිසි පරිදි හඳුනාගෙන නොතිබුණු බැවින් කාර්යය සඳහා සුදුසුම සහ අවශ්‍ය උපකරණය මිලදීගත්තේද යන්න තහවුරු කරගත නොහැකි විය. තවද සැපයුම්කරුගේ නම සහ ලිපිනය රහිත ඉන්වොයිසියක් සඳහා ගෙවීම්කර තිබුණු අතර ලදුපත්, භාණ්ඩ ලැබීම් පත, තොග පොත් සටහන්වලට යොමුව සහ නිකුතු නියෝග වැනි තහවුරු කිරීම් සාක්ෂි නොතිබුණි.අංක 1634 දරන වැඩපත සඳහා මෙම උපකරණ උපයෝජනය කළ බව සටහන් කර තිබුණු නමුත් ඊට අදාළ

ලිපිගොණුවට අනුව එම උපකරණ 02 මිලදී ගත් බවක් හෝ අදාළ කාර්යය සම්බන්ධයෙන් නිකුත් කළ බවක් හෝ වාර්තාගතකර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දින රු.20,000 ක් වැයකරමින් Air Compressor 01ක් මිලදී ගෙන තිබුණු අතරඅවශ්‍යතා පිරිවිතර නිසි පරිදි හඳුනාගෙන නොතිබුණු බැවින් කාර්යය සඳහා සුදුසුම සහ අවශ්‍ය උපකරණය මිලදීගත්තේද යන්න තහවුරුකරගත නොහැකි විය.තවද අයිතමයේ වෙළඳනාමය, අනු අංකය වැනි හඳුනාගැනීමේ පිරිවිතරයන් ඉන්වොයිසියේ හෝ වෙනත් ලේඛනයක හෝ සඳහන් කර නොතිබුණු අතර අංක 4005 දරන වැඩපත සඳහා උපයෝජනය කළ බව සටහන්කර තිබුණු නමුත් ඊට අදාළ ලිපිගොණුවට අනුව මෙම උපකරණය මිලදී ගත් බවක් හෝ අදාළ කාර්යය සම්බන්ධයෙන් නිකුත් කළ බවක් හෝ වාර්තාගත කර නොතිබුණි. අදාළ යන්ත්‍රය ඉන්වෙන්ට්‍රියක ඇතුළත් කරන ලද බවට සටහන් කර තිබුණු නමුත් අදාළ ඉන්වෙන්ට්‍රිය කුමක්ද යන්න හඳුනාගත නොහැකිවූ අතරම භෞතික පරීක්ෂාව සඳහා HITECH BRAND යන වෙළඳ ලකුණ සහිත Air Compressor 01 ක් ඉදිරිපත් කරන ලද නමුත් ඉන්වෙන්ට්‍රිගත හඳුනා ගැනීමේ අංකයක් එහි සඳහන් කර නොතිබුණු බැවින් යථෝක්ත දිනයේදී මිලදීගත් භාණ්ඩයමද යන බවතහවුරුකරගත නොහැකි විය.

(ඉ) කර්මාන්ත ශාලාව සතුව පැස්සුම් කටයුතු සඳහා අවශ්‍ය, උපකරණ සහ සේවකයින් සිටියදී 2012 දෙසැම්බර් 05 දින රු.2,142,000 ක් වැයකර පැස්සුම් කටයුතු බාහිර පාර්ශවයක් වෙත ලබාදී තිබුණි.සේවාව ලබාගෙන තිබුණුඅංක 2083 දරන වැඩපතට අදාළ ලිපි ගොණුව අනුව සේවාව ලබාගත් බව තහවුරු කරගත නොහැකිවූ අතරසේවය කවර කාලපරිච්ඡේදයක් තුළදී ලබාගත්තේද යන්න හෝ මිලගණන් හෝ ඉන්වොයිස් වටිනාකම ගණනය කළ ආකාරය හෝ පැහැදිළි කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි නොතිබුණි.

3.10 අවිධිමත් ගනුදෙනු

---------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණයවූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

---------------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂය තුළදී රු.4,592,228 ක් වටිනා කඳන් දැව තොගයක් මිලදී ගෙන තිබුණි.මිලදීගත් දින සිට දින 35 ත් 98 ත් අතර කාලයකට පසුව ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන තිබුණි.

(ii) 2012 පෙබරවාරි 08 දින විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියට අනුව තරඟකාරී මිල කැඳවීමකින් තොරව රු.3,970,111 ක් වැයකර මහෝගනී දැව තොගයක් සෘජුවම රාජ්‍ය දැව සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි. ඉන් රු. 3,229,557 ක් වටිනාකමවූ තොගයක් 2013 මාර්තු 29 දින වන විටත් වැහි ආවරනයක් රහිතව ගබඩාකර තිබුණි.

3.11 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨමට්ටම | 21 | 15 | 06 |
| (ii) තෘතියික මට්ටම | 07 | 05 | 02 |
| (iii) ද්විතියික මට්ටම | 156 | 125 | 31 |
| (iv) ප්‍රාථමික මට්ටම | 445 | 346 | 99 |
| එකතුව | 629 | 491 | 138 |

(ආ) නිලධාරීන්ගේ සේවයේ රැඳීසිටීමේ කාලය පාලනය කිරීම

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් සංශෝධනය කිරීමේ බලතලසහ වේලාව වෙනස් කිරීම සාධාරණ අවස්ථා පැහැදිළිව සඳහන් කරමින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීම් අනුමත කිරීමේ බලතල ඒ ඒ අංශ ප්‍රධානීන් වෙත ලිඛිතව පවරා නොතිබුණි. වෙනස් කිරීම් අනුමත කර තිබුණු නිලධාරියා කවරෙකුද යන්න හඳුනා ගැනීමට හැකිවන පරිදි නිලධාරියාගේ නම, තනතුර යොදා අත්සන් කර නොතිබුණු අතරඅනුමැතිය සහිතඉල්ලීම් ලිපි අංක කර දින අනුපිළිවෙලින් ගොණුකර විධිමත් පරිදි ගොනු පවත්වා නොතිබුණි. කිසිදු විශේෂ අවස්ථාවක් නොපැවති අවස්ථාවන්වලදී මෙන්ම නිරන්තරයෙන් විනාඩි 15, 20 සහ 45 ක් වැනි කාලයක ප්‍රමාදයන් සඳහාද වේලාවන් වෙනස් කිරීමට අනුමැතියදී තිබුණු අතරනියැදියට ඇතුළත්නිලධාරීන් 09දෙනා අතරින් නිලධාරීන් 05 දෙනෙකුගේ පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් අනුමැතියකින් තොරව සංශෝධනය කර තිබුණි. ඒ අතරින් එක් නිලධාරිනියකගේ වේලාවන් සංශෝධනය සඳහාවූ අනුමැතිය ව්‍යාජ ලෙස පසුව පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු අතර තවත් නිලධාරියකු අනුමැතියකින් තොරව වේලාවන් සංශෝධනය කරගනිමින් රාජකාරි දීමනා ලබා ගෙන තිබුණි.නිලධාරීන් දෙදෙනෙකුගේ නිවාඩු ලේඛනවල රාජකාරි නිවාඩු ලෙස සටහන් කර තිබුණුසමහර දිනයන් සඳහා රාජකාරි නිවාඩු අනුමත කර නොතිබුණි.

## 4. විසර්ජන ශීර්ෂය 311- ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව

------------------------------------------------------------------------

### 4.1 විගණනවිෂයපථය

----------------------

ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන්අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර්11 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149 , 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

4.3 විගණන නිරීක්ෂණ

---------------------

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් පත් අනුව විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වාවූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.8 දක්වාවූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

-------------------------------------------

(i) දෙපාර්තමේන්තුවවිසින්පහතදැක්වෙනලේඛනපවත්වානොතිබුණුඅත රඇතැම්ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
| --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි සහ පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| පරිගණක සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනමම පවත්වා ගතයුතු ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට හා ඉකුත් වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.27,022,852 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇති කර ගැනීම.

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු. 1,000,000 ක සේවා ගාස්තු ආදායම් රජයේ ආදායමට බැර කර නොතිබුණු අතර ඒ වෙනුවට දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් කිහිපයකට අධිභාර කර තිබුණි. එමගින් එම වැය විෂයන්වල වියදම අඩු කිරීම නිසා වැය කළ හැකි ප්‍රතිපාදන ප්‍රමාණය වැඩිවී තිබුණි. එම වැඩි කරගත් ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝගී කරගෙන වාහන අළුත්වැඩියාව, ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම,අතිකාල ගෙවීම් වැනි පුනරාවර්තන වියදම් සඳහා රු.700,000 ක් ද, 2011 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු සම්මන්ත්‍රණයක් වෙනුවෙන් රු.300,000 ක්දගෙවා තිබුණි. එම වැරදි සහගත ගිණුම්කරණය නිසා මුදල් රෙගුලාසි 94 හි දැක්වෙන විධිවිධානවලට පටහැනිව, අනුමත මූල්‍ය ප්‍රතිපාදන ඉක්මවා කර තිබුණු වියදම් ගිණුම්වලින් හෙළිදරව් වී නොතිබුණි.

(ඇ) අරමුණුවලට පටහැනි ගනුදෙනු

----------------------------------

පසුගිය වර්ෂයේ සීමාව ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණු රු.300,000 ක බැරකම්, වෙනත් නිශ්චිත කාර්යයක් සඳහා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදනයන් උපයෝගී කරගනිමින් පියවා තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

--------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 31101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,117,434 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ii) එම හිඟහිටි ණය ශේෂ අතරින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සම්පූර්ණයෙන්ම පටහැනි ලෙස 1997 වර්ෂයේදී නිලධාරියකු වෙත ලබාදී තිබුණු දේපළ ණයකින් , වර්ෂ 03 ට වඩා වැඩි කාලයක් හිඟ හිටි ණය ශේෂය වූ රු.121,305 ක් අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට හැකියාවක් නොමැති බව තහවුරුවී තිබුණි.

(iii) මුළු හිඟහිටි ණය ශේෂය රු.357,217 කට අදාළ ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ණය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග හෝ ණය අයකර නොගැනීමට හේතු හෝ අනාවරණය කර ගත නොහැකි විය. ලිපිගොනු පිළිබඳ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම ලිපිගොනු සොයා ගත නොහැකි බව විගණනය වෙත දන්වා තිබුණි.

4.4 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය

-----------------------------------------

4.4.1 සංයුක්තසැලැස්ම

-------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව, 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙලකර නොතිබුණි.

4.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැතිඅංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළතපාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2013 නොවැම්බර් 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

4.4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. එසේම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

-------------------------------------------------------

නිවැරදි පියවර සහ පසුවිපරම් කිරීමේ අදහසින් විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය නොකරන බැවින් විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

4.5 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුව සතු වත්කම් පිළිබඳ තොරතුරු පවත්වා නොතිබීම

--------------------------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුමට අනුව දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල වටිනාකම රු.11,154,709 ක් වූ අතර දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල වටිනාකම්එම ගිණුමෙහි දක්වා නොතිබුණි. ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රමාණයහෝ අයිතිය දෙපාර්තමේන්තුව සතු බව තහවුරු කිරීමට අවශ්‍ය ඔප්පු හෝ ඒ හා සමාන වෙනත් ලියකියවිලි සහ වෙනත් පාර්ශව වෙත පවරා තිබුණු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් පැවරීමට ලබාගත් අනුමැතිය, පැවරීමේ ලිපි සහ භාරගත් බවට සහතික ආදීවූ තොරතුරුද දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

4.6 අනුකූල නොවීම්
-----------------

(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම
---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්රෙගුලාසි | | |
| | මුදල්රෙගුලාසි94(1) | 1,838,761 | සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි. |
| | මුදල්රෙගුලාසි102, 104, 109 | 60,389 | වාහන අනතුරක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර අලාභය අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන චක්‍රලේඛය හා 2012 ඔක්තෝබර් 07 **දිනැතිඅංක** BD/A/AO/BC දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2,160,000 | පුද්ගලික මූල්‍ය ප්‍රතිලාභ ලැබෙන අයුරින් නිලධාරීන් 06 දෙනෙකු ප්‍රවාහන දීමනාගෙවා තිබුණි. |
| (iii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| | 2006 ජුලි 30 දිනැති අංක 422 දරන චක්‍රලේඛය | | 2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු වත්කම් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි වල ප්‍රමාණය, අයිතිය සහ වටිනාකම තහවුරු කර ගත නොහැකි විය. |

4.7 කළමනාකරණ දුර්වලතා

----------------------------

(අ) ආදායම් රැස්කිරීම

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංචාරක බංගලා සහ විශ්‍රාමශාලාවල කුළී ආදායම් එකතු කිරීමේ සහ ප්‍රේෂණය කිරීමේ බලය කිසිවෙකු වෙත පවරා නොතිබුණි. නමුත් එම කුළී ආදායම්, සංචාරක බංගලා සහ විශ්‍රාම ශාලාවල භාරකරුවන් යොදවා එකතු කර ගෙන තිබුණි.

(ii) උපපත්‍රිකා පොත් ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබුණු අතර කුවිතාන්සි පොත් ලබා ගන්නා නිලධාරියාගේ නම හා තනතුර එහි සටහන් කර නොතිබුණි. කුවිතාන්සි පොත් භාරගත් බවට පොදු 219 ආකෘති පත්‍රයෙන් භාරගැනීමේ කුවිතාන්සියක් ලබාගෙන ගොනු ගතකර නොතිබුණි.

(iii) කුවිතාන්සි පොත්වල අවශ්‍යතාවය දක්වමින් ශාඛා කාර්යාල ප්‍රධානියෙකුගේ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත්ව නොතිබුණු අතර මාණ්ඩලික නිලධාරියෙකුගේ අනුමැතියකින් තොරව කුවිතාන්සි පොත් නිකුත් කර තිබුණි.

(iv) මසකට හෝ දෙකකට පාවිච්චි කළ හැකි කුවිතාන්සි පත් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමකින් තොරව වරකට කුවිතාන්සි පත් 100 ක් සහිත පොත් විශාල ප්‍රමාණයක් ශාඛා කාර්යාල වෙත නිකුත් කර තිබුණි. එසේ නිකුත් කිරීමේදී ඊට පෙර නිකුත් කර තිබුණ පොත් පාවිච්චි කර අවසන්වී ඇත්ද යන බව හෝ පාවිච්චි කර අවසන් පොත් ප්‍රධාන කාර්යාලය වෙත ආපසු ලැබී ඇත්ද යන බව හෝ තහවුරු කර ගැනීමකින් තොරව අළුත් කුවිතාන්සි පොත් නිකුත් කර තිබුණි.

(v) කතරගම, මහියංගනය, පොළොන්නරුව, දෙවිනුවර සහ අනුරාධපුරය යන ශාඛා කාර්යාල වෙත සහ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත 2000 වර්ෂයේ සිට 2012 වර්ෂය අතරතුර කාලයේදී නිකුත් කර තිබුණු මුළු කුවිතාන්සි පොත් සංඛ්‍යාව 1,211 ක් වූ අතර ඉන් පාවිච්චි කර ප්‍රධාන කාර්යාලය වෙත ආපසු භාරදී තිබුණු

කුවිතාන්සි පොත් සංඛ්‍යාව 102 ක් විය. ඒ අනුව කුවිතාන්සි පොත් 1,109 ක් ප්‍රධාන කාර්යාලය වෙත ආපසු භාරදී නොතිබුණි. භාරදී නොතිබුණු පොත් ආදායම් එකතු කිරීම සඳහා පාවිච්චි කළ පොත්ද යන්න තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොතිබුණි. 2000 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළදී ශාඛා කාර්යාල වලින් ලැබුණු ආදායම් වාර්තා හෝ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(vi) ශාඛා කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණයවූ මුදල්, ශාඛා කාර්යාල වෙතින් ලැබෙන ආදායම් වාර්තාව සමඟ සහ ශාඛා කාර්යාල විසින් නිකුත් කරන ලද කුවිතාන්සිවල පිටපත් සමඟ සැසඳීම කර නොතිබුණි.

(vii) ශාඛා කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කළ මුදල් සඳහා කුවිතාන්සියක් නිකුත් කර නොතිබුණි.

(viii) ශාඛා කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කළ මුදල්, ප්‍රධාන කාර්යාලයේ මුදල් පොතට වහාම හර කළ යුතු නමුත් ප්‍රමාදවී හර කර තිබුණු අවස්ථා විය.

(ආ) සංචාරක බංගලා, සංචාරකයින් වෙත වෙන් කරදීමේ සහ මුදල් අයකිරීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව පමණක් නොව බංගලා භාරකරුවන්ද නියැලී තිබුණු අතර කිසිදු අභ්‍යන්තර පාලනයකින් තොරව බංගලා භාරකරුවන් වෙත මුදල් අයකිරීමේ කුවිතාන්සි පොත් නිකුත් කර තිබුණු බැවින් මූල්‍ය අක්‍රමිකතාවයන් සිදුවීමේ වැඩි ඉඩකඩක් පවතින බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 4.8 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

----------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨමට්ටම | 40 | 14 | 26 |
| (ii) තෘතියික මට්ටම | 13 | 02 | 11 |
| (iii) ද්විතියික මට්ටම | 122 | 80 | 42 |
| (iv) ප්‍රාථමික මට්ටම | 47 | 26 | 21 |
| එකතුව | 222 | 122 | 100 |